කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2015

2020 - අගෝස්තු

**BCOME 1015 - කළමනාකරණ මූලධර්ම**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්ණ අංක 01

(අ) කළමනාකරණය නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(ආ) සංකල්පනාත්මක කුසලතාවය (conceptual skills), සංවිධාන වල සිටින පළමු පෙළ කළමනාකරුවන්ට වඩා ඉහල පෙළ කළමනාකරුවන්ට අවශ්‍ය වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 07)

(ඇ) වත්මන් පරිසරයේ, සංවිධානවල සාර්ථකත්වයට වඩාත්ම අවශ්‍යවන්නේ කාර්යක්ෂමතාවයද (effienciency), සඵලත්වයද (effectiveness) ඔබගේ අදහස පැහැදිලි කරන්න

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 02

(අ) විද්‍යාත්මක කළමනාකරණයේ (scientific management) මූලධර්ම සඳහන් කරමින්, වර්තමානයේ එය ප්‍රායෝගිකව විවේචනය කර ඇත්තේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) න්‍යායාත්මකව යෝජනා කර ඇති සැලසුම් වර්ග (types of plans) ගෙනහැර දක්වන්න.

(ලකුණු 05)

(ඇ) කොරෝනා වයිරස් හේතුවෙන් ප්‍රධාන විදේශ සැපයුම්කරුවගේ අමුද්‍රව්‍ය නොලැබීම නිසා සහ සේවක නොපැමිණීම හේතුවෙන් XY නිෂ්පාදන සමාගම වසා දැමීමට තීරණය කරමින් සිටි. ඔබ මෙම සමාගමේ ඉහල මට්ටමේ කළමනාකරුවෙක් නම්, මේ සම්බන්ධව ඔබ ගන්නා සැලසුම්/ක්‍රියාමාර්ග සහ අභිප්‍රේරණ ක්‍රම මොනවාද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 03

(අ) " යහපත් නායකත්ව තත්වයක් සඳහා බලපානු ලබන විචල්‍යයන් කිහිපයක් පවතී" ඒ මොනවාද?

(ලකුණු 04)

(ආ) නායකත්වයේ චර්යාත්මක න්‍යායන් (behavioural theories) සංවිධානමය උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඇ) යාන්ත්‍රික ආයතන (mechanistic organizations) වර්තමානයේ කලාතුරකින් භාවිතා වේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 04

(අ) ඵලදායි සන්නිවේදනයක පවතින මූලිකාංග මොනවාද?

(ලකුණු 05)

(ආ) ඔබගේ ආයතනය තුල වන කටකතා (rumours) පාලනය කිරීමට ඔබට කළමණාකරුවෙකු වශයෙන් ගත හැකි පියවර මොනවාද?

(ලකුණු 05)

(ඇ) "දෙපාර්තුමේන්තුකරණය යනු සංවිධානයක් එහි විවිධ ක්‍රියාකාරකම් කාණ්ඩ කරන ආකාරයයි". සංවිධානයක් දෙපාර්තමේන්තුගත කළ හැකි බොහෝ ක්‍රම තිබේ. වර්තමාන සංවිධාන තුළ දැකිය හැකි දෙපාර්තමේන්තුකරණ වර්ග (types of departmentalization) සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 05

(අ) වත්මන් සංවිධානවල දකිනට ලැබෙන ප්‍රධානතම පාලන උපකරණ (controlling tools) මොනවාද?

(ලකුණු 05)

(ආ) සංවිධානවල අධි මධ්‍යගතකරණය කෙරෙහි බලපාන සාධක මොනවාද?

(ලකුණු 05)

(ඇ) තීරණ ගැනීමේ ක්‍රියාවලිය (decision making process) සංවිධානයක උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

පහත සඳහන් පද කෙටියෙන් විස්තර කරන්න.

(අ) විමධ්‍යගතකරණය (Decentralization)

(ආ) පාලන පරතරය (Span of Control)

(ඇ) පාලන ක්‍රියාවලිය (Controlling Process)

(ඉ) අවස්ථානුකූල නායකත්ව න්‍යාය (Contingency Leadership Theory)

(එකකට ලකුණු 05 බැගින් = මුළු ලකුණු 20)